සීමාසහිත මහවැලි උපදේශක සේවා
(පුද්ගලික) කාර්යාංශය
වාර්ෂික වාර්තාව 2022

MAHAWELI CONSULTANCY BUREAU

ප්‍රධාන සහාය භවුල්කාර

වාරිමාර්ග පාර්ශවය.

සීමාසහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශය

වාර්ෂික වාර්තාව
2022

ප්‍රධාන කාර්යාලය	No. 11, ජාවත්ත පාර, කොළඹ 05
දුරකථන	+94 011 258 3711
ෆැක්ස්	+94 011 258 2611
වෙබ් අඩවිය	www.mcbsl.lk
විද්‍යුත් තැපෑල	mahaweliconsultancyb@gmail.com
බැංකුකරු	ලංකා බැංකුව / සම්පත් බැංකුව
සභාපති	වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්
ප්‍රධාන විධායක නිලධාරී	ඉංජිනේරු චන්දන එදිරිසූරිය මහතා
විගණක	විගණකාධිපති

වාර්තාව පිළිබඳව

සීමාසහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශය 2022 වර්ෂය සඳහා සිය වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. වර්ෂ 2020 දී වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ මෙම කාර්යාංශය නැවත ස්ථාපිත කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කරන මෙම වාර්තාව සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

මෙම වසරේ වාර්තාවේ තේමාව වන "අරමුණු සහගත වර්ධනය" මගින් අපගේ ප්‍රගමණය සහ උපායමාර්ගික ක්‍රියාකාරකම් පිළිබඳ පුළුල් දළ විශ්ලේෂණයක් සපයයි. වසර පුරා, අපගේ මෙහෙවර වන නගර සහ පරිසරය වඩාත් තිරසරලෙස අනාගතය වෙනුවෙන් තහවුරු කිරීම යන සංකල්පයට දැඩි ලෙස අනුගත වෙමින් අපගේ මෙහෙයුම් පුළුල් කර ඇත.

අප ගැන - මහවැලි උපදේශක සේවා කාර්යාංශය (MCB)

1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරී පනත යටතේ 1998 ජුනි 18 වැනි දින සංස්ථාපිත සීමා සහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශය මහවැලි අධිකාරියේ විෂය පථය තුළ උපදේශක සේවා සැපයීමේ කාර්යය සිදුකරයි. වර්තමානයේ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මහවැලි උපදේශක කාර්යාංශයෙහි නායකත්ව කණ්ඩායම පහත පරිදි වේ:

යූ.ඩී.සී. ජයලාල් මහතා - සභාපති / අධ්‍යක්ෂ

ඉංජිනේරු ඊ.ඒ.සී.කේ. එදිරිසූරිය - ප්‍රධාන විධායක නිලධාරී / විධායක අධ්‍යක්ෂ

වයි.එම්. සෙනරත් ගුණසේකර මහතා - අධ්‍යක්ෂක

ඉංජිනේරු ඩී.එම්.එන්.ජේ. ධනපාල - අධ්‍යක්ෂක

එස්.ජී.සී.ආර්. දමයන්ති මිය- විධායක නොවන අධ්‍යක්ෂ

ටී.ජේ. මීගස්තැන්න මිය – අධ්‍යක්ෂක

අපගේ විවිධාංගීකරණය වූ කාර්යතලයේ ශක්තිමත් පදනම් මත අපගේ සාර්ථකත්වය තහවුරුවී ඇත. ඉමහත් කැපවීමකින් කටයුතු කරන අපගේ කණ්ඩායම සිය පූර්ණ හැකියාවන් සාක්ෂාත් කර ගැනීම උදෙසා සුවිශේෂී දායකත්වයක් ලබා දෙමින් අපගේ කර්තව්‍යයන් මෙහෙයවයි. තවදුරටත් ඉදිරියට යමින්, අපගේ ව්‍යාපාරය ප්‍රශස්තකරණය කිරීමට සහ උපායමාර්ගිකව පෙළගැස්වූ ප්‍රවේශයක් හරහා අපගේ පරිමාණයෙන් සහ විෂය පථයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට අපි කැපවී කටයුතු කරන්නෙමු.



"උපදේශන සහ සංවර්ධන ක්‍රියාවලියේ පුද්ගලයින් සහසම්බන්ධ කිරීමේ ප්‍රමුඛ භූමිකාව බවට පත්වීම "



"ඉහළම වෘත්තීය ප්‍රමිතීන්ට අනුකූලව සැබෑ කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා විශේෂඥතාව සහ සම්පත් උපයෝගී කරගනිමින් විශිෂ්ටත්වය සඳහා කැපවී කටයුතු කිරීම "

ආයතනික තොරතුරු

සමාගමේ නම:

සි/ස මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශය

නෛතික ස්වභාවය:

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වගකීමෙන් සීමිත පුද්ගලික සමාගමක් වශයෙන් ස්ථාපිත කර පසුව වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ නැවත ස්ථාපිත කරන ලදී.

සමාගමේ ලියාපදිංචි අංකය සහ දිනය:

PV 16564 1998.06.18

ලියාපදිංචි කල කාර්යාලය:

11, ජාවත්ත පාර. කොළඹ. 05

අධ්‍යක්ෂක මණ්ඩලය:

යූ.ඩී.සී. ජයලාල්
ඉංජිනේරු ඊ.ඒ.සී.කේ. එදිරිසූරිය
ටී.ජේ. මීගස්තැන්න
ඩී.එම්.එන්.ජේ. ධනපාල
වයි.එම්. සෙනරත් ගුණසේකර
එස්.ජී.සී.ආර්. දමයන්ති

සමාගම් ලේකම් සහ නීති නිලධාරි

ටී.ඩී සමරවික්‍රම
නීතිඥ, සමාගම් ලේකම්
එල්එල්එම්, එල්එල්බී

විගණකවරුන්

ජාතික විගණන කාර්යාලය
306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

ප්‍රධාන බැංකුකරුවන්

සම්පත් බැංකුව
ලංකා බැංකුව

සීමා සහිත මහවැලි උපදේශක සේවා කාර්යාංශයේ ධූරාවලිය

(මහවැලි උපදේශක සෙවා කාර්යාංශයේ ධූරාවලිය සඳහා කරුණාකර ඇමුණුම 01 බලන්න)

මූලා විශ්ලේෂණ !!!









සීමාසහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශය

මූල්‍ය විශේෂතා

	2022 Rs.	2021 Rs.	2020 Rs.	2019 Rs.	2018 Rs.	2017 Rs.	2016 Rs.	2015 Rs.	2014 Rs.	2013 Rs.
ආදායම	31,287,011.00	9,526,584.00	-	29,808,040.00	90,203,907.00	221,867,705.00	150,027,542.00	205,827,348.00	185,459,491.00	14,505,5678.00
දළ ලාභය	19,425,980.00	7,158,134.00	(1,907,554.00)	17,274,798.00	32,115,276.00	32,245,491.00	42,429,684.00	33,704,866.00	27,029,335.00	145,055,678.00
බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය	6,430,563.00	(7,284,205.00)	(13,924,210.00)	2,373,187.00	3,181,168.00	3,625,207.00	7,388,061.00	1,882,334.00	1,371,416.00	924,219.00
බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය	6,430,563.00	(7,284,205.00)	(13,924,210.00)	2,373,187.00	3,181,168.00	2,170,367.00	6,462,538.00	772,344.00	1,203,200.00	650,954.00
මුළු වත්කම්	86,975,066.00	80,737,659.00	94,287,675.00	109,736,841.00	129,582,010.00	197,851,820.00	146,298,346.00	141,551,590.00	132,209,741.00	146,511,705.00
ප්‍රකාශිත ප්‍රාග්ධනය	63,850.00	63,850.00	63,850.00	63,850.00	63,850.00	63,850.00	63,850.00	63,850.00	63,850.00	63,850.00
මුළු හිමිකම්	75,958,368.00	69,750,896.00	77,499,519.00	82,432,146.00	79,885,610.00	75,767,731.00	73,597,363.00	67,254,826.00	66,482,482.00	65,279,281.00
මුළු හිමිකම් ශේෂය	86,975,066.00	80,737,659.00	94,287,675.00	109,736,841.00	129,582,009.00	197,851,820.00	146,298,346.00	141,551,590.00	132,209,741.00	146,511,705.00
ජංගම වත්කම්	42,538,179.00	35,671,732.00	43,799,867.00	58,879,685.00	65,426,073.00	112,520,394.00	68,907,278.00	61,890,260.00	47,239,403.00	73,598,230.00
ජංගම වගකීම්	10,404,833.00	10,374,897.00	16,176,290.00	26,692,833.00	49,084,537.00	121,201,406.00	69,436,119.00	62,437,813.00	50,786,288.00	61,495,227.00


උපදේශන සේවා ආදායම (රු.මි.)
ආදායම රු.මි.
250
200
150
100
50
0
15
185
206
150
221
90
30
0
10
31
2013
2014
2015
2016
2017
2018
2019
2020
2021
2022
වර්ෂය


මුළු වත්කම් (රු.මි.)
මුළු වත්කම් රු.මි.
200
180
160
140
120
100
80
60
40
20
0
146.5
132.2
141.5
146.2
197.8
129.5
109.7
94.2
80.7
86.9
2013
2014
2015
2016
2017
2018
2019
2020
2021
2022
වර්ෂය

සභාපතිතුමාගේ සමාලෝචනය



කොවිඩ්-19 වසංගතය, සැලකිය යුතු මට්ටමක වූ ආර්ථික පසුබෑම සහ ලොව පුරා පැවති සමාජ පීඩනය යනාදී වශයෙන් පවැති අභියෝගවලට ඔරොත්තු දීමේ හැකියාව ඇතිකර ගනිමින් සහ මෙම ගෝලීය අභියෝග ජය ගැනීම සඳහා නව විසඳුම් නිර්මාණය කරමින් ගතවූ 2022 වර්ෂය අපහට සුවිශේෂී ලෙස සනිටුහන් වූ වසරක් විය. දේශීය වශයෙන් සහ ගෝලීය වශයෙන් යන දෙආකාරයෙන්ම එල්ලවූ අභියෝග හේතුවෙන් අපට අවංකභාවය සහ විශේෂඥතා ඥාණය යන හරපද්ධතීන් මත කේන්ද්‍රගතව අපගේ ව්‍යාපාරික ප්‍රවේශයේ උපායමාර්ගික වෙනසක් සිදුකිරීම අත්‍යවශ්‍ය විය. මෙවන් පසුබිමක 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම ඉමහත් සතුටින් යුතුව මෙසේ ඉදිරිපත් කරමි.

ආර්ථික අවපාතය දේශීය සංචාරක ව්‍යාපාරයේ වර්ධනයට දිගින් දිගටම බාධා පමුණුවමින්, දරාගත නොහැකි ණය මට්ටම් තවදුරටත් අයහපත් අතට පත්කරමින් විදේශ විනිමය අර්බුදය උග්‍ර කළේය. මෙම අභියෝග මගින් අපේ ප්‍රගමණයට විශාල බාධාවන් එල්ලවිය.

කෙසේ වෙතත්, 2022 දී අපගේ සමාගම පෙර වසරට සාපේක්ෂව ආදායමේ 228% ක වැඩිවීමක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 31.2 ක් උපයා ගැනීමට සමත් වූ අතර එය සුවිශේෂී තත්ත්වයකි. පෙර වසරේ වාර්තා වූ රුපියල් මිලියන 7.2 ක අලාභය හා සැසඳීමේ දී අප සමාගමේ මෙම වර්ෂයේ බදු පෙර ලාභයේ (PBT) කැපී පෙනෙන වෙනසක් සිදුවෙමින් රුපියල් මිලියන 6.4ක ප්‍රමාණයට ළඟා වූ බව වාර්තා කිරීමට හැකිවීම පිළිබඳව මම ආඩම්බර වෙමි. මෙහිදී අප සමාගම රට මුහුණ දී ඇති අභියෝගවලට සාර්ථකව මුහුණ දෙමින් සුවිශේෂී ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කර ඇත.

රට තුළ පවතින ආර්ථික, සමාජීය සහ දේශපාලන අවිනිශ්චිතතාවය මගින් අපගේ වර්ධනාභිලාශයන්ට අභියෝග එල්ල වුවද යළි ස්ථාවරත්වයට පත්වීම සඳහා ජාතියට ඇති හැකියාව සම්බන්ධයෙන් අපි සුබවාදීව සිටිමු. ආර්ථිකය ප්‍රකෘති තත්ත්වයට පත්වීම සම්බන්ධයෙන් අවිනිශ්චිතතා පැවතියේ වුවද, මෙම දුෂ්කර කාලපරිච්ඡේදවලදී මෙම අභියෝග ජය ගැනීම සහ වර්ධනය ඇතිකර ගැනීම සඳහා අවස්ථා සොයාගැනීම සඳහා අපට හැකියාව පවතින බවට මා හට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට විශ්වාසයක් ඇති බව මම සතුටින් ප්‍රකාශ කරමි.

සැමට නීරෝගීමත් සෞඛ්‍යයක් ප්‍රාර්ථනා කිරීමට සහ සෑම විටම ආරක්ෂාවට ප්‍රමුඛත්වය දෙමින් කටයුතු කරන ලෙස සියලු දෙනාගෙන් ඉල්ලා සිටීමට මෙය අවස්ථාවක් කර ගනිමි. මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදයේ දී උතුම් ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදයෙන් සෑම ශ්‍රී ලාංකිකයෙකුම ආරක්ෂා වේවා යනුවෙන් මම මෙසේ ප්‍රර්ථනා කරමි.

යූ.ඩී.සී. ජයලාල්
නිලබලයෙන් පත්වූ සභාපති
ලේකම්,
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

ප්‍රධාන විධායක නිලධාරියාගේ සමාලෝචනය



2022 වසර අපගේ සමාගම මෑත වසරවල මුහුණ දුන් අභියෝග හමුවේ විශිෂ්ටත්වය අත්කර ගැනීම සඳහා වන අපගේ ඔරොත්තු දීමේ හැකියාව සහ අධිෂ්ඨානය පිළිබඳ වැදගත් පරීක්ෂාවක් සිදු කරන ලද වසරකි. මෙම කාලසීමාවේදී විපත්තිවලට මුහුණ දීම සඳහා අප සමාගම සතු ශක්තිය සහ අපගේ කණ්ඩායම සතු ශක්තිය යන කරුණු දෙකම පරීක්ෂාවට ලක් කර ඇත. අපගේ දැක්ම සාක්ෂාත් කරගැනීමේ ප්‍රයත්නයේ දී මෙහෙයුම් විශිෂ්ඨත්වය ළඟා කර ගැනීම උදෙසා වඩාත් ශක්තිමත්ව සහ වඩාත් කැපවීමෙන් යුතුව අපි මෙම අභියෝගවලට සාර්ථකව මුහුණ දුන් බව මම සතුටින් ප්‍රකාශ කරමි.

විශාල පසුබෑම් මධ්‍යයේ වුවද අපගේ ගමනේ තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් පුනර්ජීවනය කරන ලද මහවැලි උපදේශක සේවා (පුද්.) කාර්යාංශයේ 2022 වාර්ෂික වාර්තාව තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් ගෞරවයකි.

අභියෝගාත්මක කාල පරිච්ඡේදයන්හිදී අපගේ මෙහෙවර සාක්ෂාත් කරගැනීම උදෙසා නොපසුබස්නා උත්සාහයක නිරතවුනු අප කණ්ඩායම විසින් දක්වන ලද අවල කැපවීම අපි ඉමහත්සේ අගය කරමු. සැබවින්ම ප්‍රබෝධමත් සහ සුමට මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා ඔබ සැමගේ උනන්දුව සහ කැපවීම අත්‍යවශ්‍ය සාධකයකි. අපි නව අදියරකට පියවර තබන විට අවිනිශ්චිතතා ඇතිවේ. කෙසේ වෙතත්, 2022 දී ස්ථාපිත කර ගන්නා ලද වර්ධනයේ ශක්තිමත් පදනම මත තවදුරටත් ගොඩනැගීමට අපි කැපවී කටයුතු කරමු. අපගේ ඉදිරි ක්‍රමෝපායන් හරහා ඵලදායිතාව ඉහළ නැංවීම, නවෝත්පාදනයන් වැඩි දියුණු කිරීම, අපගේ කාර්ය සංස්කෘතිය ප්‍රතිව්‍යුහගත කිරීම සහ නව වෙළඳපල අවස්ථා පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. ජාත්‍යන්තරව පිළිගත්, සහතික කළ, විශ්වසනීය සහ උසස් තත්ත්වයේ උපදේශක සේවා අප ගනුදෙනුකරුවන් වෙත තරහකාරී මිල ගණන් යටතේ ලබා දීම අපගේ ඉලක්කය වේ.

කාර්මික විප්ලවයේ සහ පාරිසරික තිරසාරත්වයේ යුගයේ සමෘද්ධිමත් විය හැකි තිරසාර ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමේ අපගේ දිගුකාලීන අරමුණ සාක්ශාත් කර ගැනීම උදෙසා සැලකිය යුතු වර්ධනයක් සහ අඛණ්ඩ ප්‍රගතියක් 2022 දී අපි අපේක්ෂා කරමු. අපගේ කාර්ය මණ්ඩලය විසින් විදහා දක්වන ලද කැපවීම, අපගේ දැක්ම, මෙහෙවර සහ හුවමාරු කරගත් හරපද්ධතීන්වල ශක්තිමත් පදනම සමඟ ඒකාබද්ධව, අනාගත අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට අප සතු හැකියාව පිළිබඳ ප්‍රබල විශ්වාසයක් පවතී. තවද, නව සන්ධිස්ථාන කරා ළඟා වෙමින් උපදේශක සේවාවන්හි ගෝලීය ප්‍රමුඛයා ලෙස අපගේ ස්ථාවරය ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින්, වර්ධන අපේක්ෂාවන් මුදුන්පමුණුවා ගැනීමට සහ අපගේ කොටස් හිමියන් සඳහා වටිනාකම් එක් කිරීමට කිරීමට අපි අඛණ්ඩව කැපවී සිටිමු.

අවසාන වශයෙන්, ලබාදුන් විචක්ෂණශීලී උපදෙස් සහ නායකත්වය සඳහා සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මගේ අවංක කෘතඥතාව පළ කරමි. අභිවෘද්ධිය සඳහා වූ අපගේ ප්‍රයත්නයේදී ඒ සඳහා රජයේ බලධාරීන් විසින් දක්වන අවල සහයෝගයට මම ස්තුතිවන්ත වෙමි. වෙනස්වන තත්වයන් හමුවේ ඊට අනුවර්තනය වීම සම්බන්ධයෙන් අප කාර්ය මණ්ඩලය සතුවූ ඔරොත්තු දීමේ හැකියාව, ලබාදුන් නොසැලෙන සහයෝගය, පෙන්නුම් කරන ලද අතිවිශිෂ්ට කාර්ය සාධනය සම්බන්ධයෙන් අපගේ සමාගමේ කාර්ය මණ්ඩලයට මම අතිශයින් කෘතඥ වෙමි. අවංකභාවය, කැපවීම සහ අපගේ හැකියාවන් කෙරෙහි විශ්වාසයෙන් යුතුව අපගේ අරමුණු ජයගනිමු.

ඉංජිනේරු චන්දන එදිරිසූරිය
ප්‍රධාන විධායක නිලධාරි

මහවැලි උපදේශක සේවා කාර්යාංශය.

මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශයෙහි ආයතනික පාලනය

සමාගමේ ආයතනික පාලනය සම්බන්ධයෙන්වන තම වගකීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මනා ලෙස දැනුවත්වන අතර සියලුම පාර්ශවකරුවන්ට වගවීමේ ඉහළම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමේ වැදගත්කම හඳුනා ගනී. සමාගම සිය සියලු ගනුදෙනුවලදී අවංකභාවය, විනිවිදභාවය සහ සාධාරණත්වය පවත්වා ගනිමින් කටයුතු කිරීමට කැපවී සිටී. ආයතනය පුරා මෙකී උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කරනුවස් පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිය යුතු ලෙස අවධාරණය කරයි.

සභාපතිතුමාගේ කාර්යභාරය

සභාපතිවරයාගේ මූලික කාර්යභාරය වනුයේ සමාගමේ උපදෙස් සහ උපාය මාර්ග සැකසීම හා ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ සඵලතාවය සහතික කිරීමයි. මීට අමතරව, සභාපතිවරයා සමාගමේ අදහස් සහ ප්‍රතිපත්ති බාහිර පාර්ශ්වකරුවන් හට ඉදිරිපත් කිරීමේදී සමාගමේ ප්‍රධාන නියෝජිතයා ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂක මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය විවිධ ක්ෂේත්‍රවල පළපුරුද්ද, වෘත්තීයභාවය සහ විශේෂිත දැනුම ලබා දෙමින් සමාගමේ ඉහළම පාලන අධිකාරිය ලෙස සේවය කරයි. සමාගමේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම මණ්ඩලයට පැවරී ඇති අතර සමාගමේ යහපත වෙනුවෙන් යහපත් ව්‍යාපාරික විනිශ්චයක් ක්‍රියාත්මක කිරීම එමගින් අපේක්ෂා කෙරේ.

අඛණ්ඩ පැවැත්ම

සමාගමේ මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහය සමාලෝචනය කිරීමෙන් පසු, අනාගතයේදී මෙහෙයුම් මනාව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් තරම් සම්පත් සමාගම සතුව පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි. එමනිසා, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා මණ්ඩලය විසින් "අඛණ්ඩතා පදනම" අනුගමනය කර ඇත.

වගවීම

වාණිජ යතාර්ථයේ සීමාවන් තුළ මූල්‍ය තොරතුරු සම්පූර්ණයෙන් හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් මණ්ඩලය සැලකිය යුතු ලෙස අවධාරණය කරයි. එය සමාගමේ ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ පද්ධතිවල මෙන්ම එහි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණවල විශ්වසනීයභාවය පිළිබඳව කරනු ලබන නිරන්තර සමාලෝචන සහ අධීක්ෂණය තුළින් තහවුරු කිරීමට සාධනීය ක්‍රියාමාර්ග ගෙන ඇත.

ආචාරධර්ම සම්මතයන්

සියලුම ව්‍යාපාරික කටයුතුවලදී උසස් ආචාරධර්ම සම්මතයන් ආරක්ෂා කිරීමට මණ්ඩලය කැපවී කටයුතු කරයි. සේවකයින්ට සහ නියෝජිතයින්ට ඔවුන්ගේ හැසිරීම මෙම සම්මතයන්ට අනුකූලව පවත්වාගෙන යාමට වගබලාගනු පිණිස මේ පිළිබඳව ඔවුන් පැහැදිලිව දැනුවත් කිරීමට ප්‍රයත්න දරයි.

ආයතනික සමාජ වගකීම

සේවකයින්, සේවාදායකයින්, සැපයුම්කරුවන්, ණයහිමියන් සහ රාජ්‍ය ආයතන ඇතුළු විවිධ පාර්ශ්වකාර කණ්ඩායම්වල අයිතිවාසිකම් සහ අවශ්‍යතා සමාගම සිය මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය කාරණා ලෙස හඳුනාගනී. ආයතනික තීරණ ගැනීමේ දී මෙම කාරණා සැලකිල්ලට ගෙන එම තීරණ ගනු ලැබේ. මීට අමතරව, සමාගම පාරිසරික අභියෝග පිළිගන්නා අතර එහි ව්‍යාපාරික අරමුණු සාක්ශාත් කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී වගකීම් සහගතව කටයුතු පවත්වාගෙන යයි. සමාගම සිය ප්‍රතිපත්තියේ කොටසක් ලෙස, ආර්ථික වශයෙන් හැකියාව ඇති සෑම අවස්ථාවකදීම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට සහ ජලය සහ බලශක්තිය සංරක්ෂණය කිරීමට ප්‍රයත්න දරයි. සියලුම මෙහෙයුම් හරහා සිදු කරනු ලබන අවදානම් තක්සේරුකරණ ක්‍රියාවලියේ දී, සමාජීය සහ සදාචාරාත්මක මානයන් ඊට ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය අදාළ නව නීති සහ නියාමන අවශ්‍යතා පිළිබඳව යාවත්කාලීනවන බව සමාගම් ලේකම්වරයා තහවුරු කරයි.

සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති - 2022

තල්පිටිගල ව්‍යාපෘතිය සඳහා සමාජ ආර්ථික සමීක්ෂණ සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා උපදේශන සේවා සැපයීම
ID/HO/SESR ක්‍රියාකාරී සැලැස්ම/තල්පිටිගල/2017-03

බදුල්ල දිස්ත්‍රික්කයේ යෝජිත තල්පිටිගල ජලාශය ඉදිකිරීම හේතුවෙන් විපතට පත් පවුල්වලට සිදුවන සමාජීය හා ආර්ථික බලපෑම් අවම කිරීම ඉලක්ක කරගත් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම මෙම පැවරුමේ අරමුණ වේ. ඉඩම් අත්පත් කර ගැනීම, යළි පදිංචි කිරීම, ජීවනෝපාය සහ වෙනත් අදාළ සමාජ හා ආර්ථික බලපෑම් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම මෙයට ඇතුළත් වේ.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය විසින් සම්මත කරන ලද ස්වේච්ඡාවෙන් තොරව නැවත පදිංචි කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව ව්‍යාපෘතිය හේතුවෙන් පැන නගින නැවත පදිංචි කිරීමේ දී ඇතිවන ගැටලු ක්‍රමානුකූලව විසඳනු ලැබේ.

තල්පිටිගල ජලාශ සංවර්ධන ව්‍යාපෘතිය මධ්‍යම කඳුකරයේ උඟව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර මෙම ව්‍යාපෘතිය කන්දෙකිටිය, හාලිඇල සහ උඟව පරණගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මායිම් තුනකට විහිදේ. වාසනාගම, තෙටිල්ල, කොකටියමළුව, බෝගොඩ, යාලගමුව සහ වැතලාව යන ග්‍රාමයන්හි පිහිටි ග්‍රාම නිලධාරී වසම් නවයක් ව්‍යාපෘති ප්‍රදේශයට ඇතුළත් වේ .

මේවනවිට සතුටුදායක මට්ටමක පවතින අධිවේගී මාර්ග සහ පළාත් මාර්ග උපයෝගී කර ගනිමින් වාසනාගම ගම්මානය හරහා ව්‍යාපෘති භූමියට ප්‍රවේශ පහසුකම් සැපයේ. බර උපකරණ ප්‍රවාහනය සඳහා අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි මෙම මාර්ග වැඩිදියුණු කිරීම හෝ ව්‍යාපෘතියේ සැපයුම් අවශ්‍යතා සඳහා අවශ්‍ය පරිදි නව මාර්ග ඉදිකිරීම සිදු කරනු ලැබේ.

මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කවල මුන්දේනි ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සමාජ බලපෑම් ඇගයීම සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සඳහා උපදේශන සේවා සැපයීම

කොන්ත්‍රාත් අංකය: HO/CT/SIA&RA/Mun Aru/2017/01

මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණිය අම්පාර, මඩකලපුව, මොණරාගල සහ බදුල්ල යන දිස්ත්‍රික්ක හතරක් පුරා විහිදේ. මෙම ද්‍රෝණියේ විශාල ප්‍රෙද්ශයක් නැගෙනහිර පළාතේ අම්පාර සහ මඩකලපුව දිස්ත්‍රික්කවලට අයත් වන අතර ඉතිරි කොටස උඟව පළාතේ මොණරාගල සහ බදුල්ල දිස්ත්‍රික්කවල පිහිටා ඇත. වර්ග කිලෝමීටර්1,375ක ජල පෝෂක ප්‍රදේශයක් ආවරණය වන මුන්දෙනි ආරු ශ්‍රී ලංකාවේ ගංගා ද්‍රෝණි සිතියමේ ගංහා ද්‍රෝණිය අංක 52 (RB අංක 52) ලෙස නම් කර ඇත.

ඊසානදිග මෝසමෙන් ඇතිවන සැලකිය යුතු බලපෑම හේතුවෙන් මෙම ද්‍රෝණියට මිලිමීටර් 1926ක වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය ලැබේ. මෙම වර්ෂාපතනයෙන් ආසන්න වශයෙන් 80% ක් පමණ දෙසැම්බර් සිට ජනවාරි දක්වා ලැබෙන අතර, සමාජීය ප්‍රයෝජනය සඳහා යොදා නොගෙන මුහුදට ගලා යන ජලය ප්‍රමාණය මුළු බැහැරවීම්වලින් 60%ක් හෙවත් ඝන මීටර් මිලියන 900ක් පමණ වේ. ඓතිහාසික දත්ත මගින් වැසි සමයේදී නිරන්තර ගංවතුර ඇතිවීම, මහජන ආරක්ෂාවට සැලකිය යුතු අවදානමක් ඇති වීම සහ සැලකිය යුතු ලෙස දේපල හානි සිදු වීම වැනි කාරණා අනාවරණය වේ. අනෙක් අතට, වියළි කාලවලදී ජල හිඟය නිසා ද්‍රෝණිය තුළ කෘෂිකාර්මික කටයුතු සහ ගෘහස්ත ජල සැපයුම අඩාලවීම සිදු වේ.

මුන්දෙනි ආරු ගඟ රඹකැන් ඔය, මහඔය සහ ගල්ඔඩේ ආරු යන ප්‍රාථමික අතු ගංගා තුනකින් සමන්විත වේ. මෙම ද්‍රෝණියේ රූගම්, කිතුල්වැව, ටැම්පිටිය, වැලිගහකණ්ඩිය සහ රඹකැන් ඔය යන ප්‍රධාන හා මධ්‍යම ජලාශ පහක් සහ වාරි කෘෂිකර්මයට සහාය වන කුඩා වැව් 50කට අධික සංඛ්‍යාවක් පවතී. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මෑතකදී ඉදිකරන ලද රඹකැන් ඔය ජලාශයේ ධාරිතාව ඝන මීටර මිලියන 56ක් වේ. යෝජිත මහඔය ජලාශය දශක දෙක තුනක සිට න්‍යාය පත්‍රයේ සඳහන්ව තිබූ ව්‍යාපෘතියනි. 1892 දී පිහිටුවන ලද රූගම් වැව, මහ සහ යල කන්න දෙකේදීම අක්කර 9,752 (හෙක්ටයාර 3,948) කට ජලය සපයන පහළ ද්‍රෝණියේ ප්‍රධාන වාරි යටිතල පහසුකම ලෙස පවතී.





ක්‍රියාත්මක ව්‍යාපෘති - 2022

මහඔය ද්‍රෝණියේ යෝජිත යටිමහන ජලාශ ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශක සේවා සැපයීම

යෝජිත යටිමහන ජලාශ ව්‍යාපෘතිය කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යටිමහන ග්‍රාමය අසල මහඔය හරහා පිහිටා ඇත. මේවනවිට සේවා, කෘෂිකර්ම, නාගරික සහ කාර්මික යන අංශවලට අදාළව ජල හිඟයක් පවතින නමුදු මහඔය ද්‍රෝණියේ සැලකිය යුතු ජල සම්පත් සංවර්ධනයක් සිදු වී නොමැත.

2014 වර්ෂයේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් මූලික වශයෙන් බිංගිරිය, නාරම්මල සහ කුලියාපිටිය යන ප්‍රදේශවල වර්තමානයේ පවතින කුඹුරු සඳහා වාරි සැපයුම් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ද්‍රෝණියේ ජල සම්පත් සංවර්ධනය කිරීමේ ශක්‍යතාවයන් පිළිබඳ අනාවරණය කර ගැනීම සඳහා තොරතුරු සොයා බැලීමේ සමීක්ෂණයක් පවත්වන ලදී. නාගරික හා කාර්මික ප්‍රදේශ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම හේතුකොටගෙන පානීය හා කාර්මික ජලය සඳහා ඇති ඉල්ලුම 2050 වන විට 247.24 MCM දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. දේශගුණික විපර්යාස මෙම තත්ත්වය තවත්දුටත් තීව්‍ර කර දිගු වියළි කාල ඇතිවීමට හේතු වී ඇත. ද්‍රෝණිය ආසන්නයේ පදිංචිකරුවන් ඇත අතීතයේ නොගැඹුරු ළිං භාවිතයට නැඹුරුවී සිටි නමුත් දිගු වියළි කාලසීමාවන් සහ නාගරික ප්‍රදේශවල ජනගහන වර්ධනය මෙම මූලාශ්‍ර සිඳී යාමට හේතු වී ඇත. එයින් ඔවුන්ගේ දෛනික ජීවිතයට මෙන්ම වී වගාවට ද දැඩි බලපෑම් එල්ලවී ඇත.

යෝජිත ජලාශ ව්‍යාපෘතිය සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙනුවෙන් මහවැලි උපදේශක සේවා කාර්යාංශය විසින් ශක්‍යතා අධ්‍යයනය සිදු කරන ලදී. සැලසුම් කරන ලද සියලුම ක්ෂේත්‍ර වාරිකා උපදේශකයින් විසින් අවසන් කර ඇති අතර අවසන් වාර්තාව කෙටුම්පත් කිරීම සඳහා අවශ්‍ය කරුණු ඉදිරිපත් කර ඇත.

යෝජිත ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් තක්සේරුව සඳහා උපදේශන සේවා සැපයීම

මහවැලි උපදේශක සේවා කාර්යාංශය විසින් බහු අංශ සංවර්ධන වැඩසටහනක් සහ රජයේ ප්‍රමුඛතා කාර්යයක් වන යෝජිත ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය සඳහා පාරිසරික බලපෑම් තක්සේරුව සිදුකරනු ලැබේ. හම්බන්තොට ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතා සහ කාර්මික ජල අවශ්‍යතා සපුරාලීම, හැරවුම් මාර්ගයේ පවතින පද්ධතිවල වාරිමාර්ග දෝෂ නිවැරදි කිරීම, වත්මන් කෘෂිකාර්මික නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ව්‍යාපෘති ප්‍රදේශයේ ආසන්න වශයෙන් හෙක්ටයාර 2,500 ක පමණ නව ඉඩම්වල වාණිජ කෘෂිකර්මාන්තය දියුණු කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කර ඇත.

විසල් හම්බන්තොට සංවර්ධන ප්‍රදේශය මෙම ව්‍යාපෘතියේ මූලික ප්‍රතිලාභියා වේ. කාර්මික ජල අවශ්‍යතා ඇති ප්‍රදේශයට එම ජල අවශ්‍යතා විශ්වසනීය ලෙස සපයමින් මෙම ව්‍යාපෘතිය කලාපයේ සංවර්ධනයට සහාය වේ. මෙම ව්‍යාපෘතිය මගින් මෙම සංවර්ධන කලාපය තුළ උපායමාර්ගිකව පිහිටා ඇති මත්තල ගුවන්තොටුපළ සහ මාගම්පුර වරාය ඇතුළු දැනට පවතින යටිතල පහසුකම් සඳහා තවදුරටත් ප්‍රතිලාභ සැලසෙනු ඇත. දක්ෂිණ අධිවේගී මාර්ගය සහ නව දුම්රිය මාර්ගය දිගු කිරීමත් සමඟ ප්‍රමාණවත් තරම් ජලසම්පාදනයක් පැවතීම විසල් හම්බන්තොට ප්‍රදේශයේ සංවර්ධනය සැලකිය යුතු ලෙස වේගවත් කරනු ඇත.

<u>වියළි කලාපීය ගොවීන් සඳහා කාලගුණ උපදේශක පද්ධතියක් ස්ථාපිත කිරීම පිණිස ඩිජිටල් පද්ධතිය ශක්තිමත් කිරීම</u>

වියළි කලාපයේ දේශගුණයට ඔරොත්තු දෙන ඒකාබද්ධ ජල කළමනාකරණය කෙරෙහි අවධානය යොමු කරන ලද වසර හතක ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාවේ සහාය ඇතිව ග්‍රීන් ක්ලයිමේට් අරමුදල (GCF) වෙතින් අරමුදල් ලබාගෙන ඇත. දේශගුණික විපර්යාස හේතුවෙන් ඉහළ යන උෂ්ණත්වය, අක්‍රමවත් වර්ෂාපතනය සහ අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් පීඩාවට ලක්විය හැකි කුඩා වතු හිමියන්ගේ, විශේෂයෙන් කාන්තාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම දේශගුණයට ඔරොත්තු දෙන ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ (CRIWMP) අරමුණයි. කෘෂිකර්මය පාදනම්කරගත් ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ ජල කළමනාකරණය සඳහා අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහාය ලබාදීම සහ ආයතනික බාධක මගහරවා ගැනීම සඳහා කටයුතු කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරයි.

ප්‍රජා වාරි ජල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, කෘෂිකාර්මික භාවිතයන් වැඩිදියුණු කිරීම, විමධ්‍යගත පානීය ජල පද්ධති පුළුල් කිරීම සහ පූර්ව අනතුරු ඇඟවීම් ශක්තිමත් කිරීම සහ ගංවතුර ප්‍රතිචාර සහ ජල කළමනාකරණය සඳහා පුරෝකථන කිරීම් සිදුකිරීම පිණිස රජයේ සම-මූල්‍යකරණය මගින් පූරණය කරන ලද ග්‍රීන් ක්ලයිමේට් අරමුදලේ GCF සම්පත් ආයෝජනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකරනු ලැබේ. වැඩිදියුණු කළ ජල කළමනාකරණය, ඔරොත්තු දෙන කෘෂිකාර්මික පිළිවෙත් සහ දේශගුණික හා කාලගුණ තොරතුරු මගින් සෘජු ප්‍රතිලාභීන් 770,500 කට සහ වක්‍ර ප්‍රතිලාභීන් 1,179,800 කට ජලය ලබාදීම සහ කෘෂිකාර්මික කළමනාකරණ කටයුතු සිදුකිරීම ව්‍යාපෘතියේ අරමුණයි.

ව්‍යාපෘතියේ ගොවීන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක දිස්ත්‍රික්කවල ආපදාවට ලක්වන ප්‍රජාවන් සඳහා ඵලදායී හා කාර්යක්ෂම කාලගුණ අනාවැකි, කෘෂි කාලගුණ විද්‍යා උපදේශන සහ ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ සැපයීම, මෘදුකාංග යෙදුම් සංවර්ධනය කිරීම සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) සම්පාදනය කිරීම මෙම අධ්‍යයනයේ අවසාන අරමුණ වේ. තොරතුරු උත්පාදනය, ව්‍යාප්තිය, යෙදීම් සහ ප්‍රතිපෝෂණ යන සමස්ත ක්‍රියාවලිය පිළිබඳ සලකා බලා කාලගුණ උපදේශන, කෘෂි කාලගුණ විද්‍යා උපදේශන සහ ආපදා පූර්ව අනතුරු ඇඟවීම් යන ප්‍රධාන කාරණා තුනක් පිළිබඳව මෙම අධ්‍යයනය මගින් අවධානය යොමු කරනු ඇත. ව්‍යාපෘති දිස්ත්‍රික්කවල ගංවතුර අවදානම, ජල හිඟය සහ නියඟ තත්ත්වයන් අවම කිරීම මෙහි අරමුණ වේ.

වර්තමානයේ, ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය නියෝජිතායතන කාලගුණය ආශ්‍රිත උපදේශන සකස් කිරීම, නිකුත් කිරීම සහ ප්‍රතිචාර දැක්වීම යන කාර්යයන්හි නියැලී සිටී. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි ජාතික ආයතන මෙම අනාවැකි සහ පූර්ව අනතුරු ඇඟවීම් සකස් කරයි. පළාත් කෘෂිකර්ම, පළාත් වාරිමාර්ග, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි දිස්ත්‍රික් කාර්යාල සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන උපදේශන ප්‍රචාරය කිරීම හා සම්බන්ධ වේ. මීට අමතරව, දිස්ත්‍රික් ආපදා සම්බන්ධීකරණ ඒකක සහ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ආපදා පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරය කරනු ලබයි.

මෙම උපදේශන සහ පූර්ව අනතුරු ඇඟවීම් උත්පාදනය කිරීම, සම-සංවර්ධනය කිරීම සහ අදාළ කර ගැනීම සඳහා පවතින සහ විභවතා සහිත ඩිජිටල් පද්ධති කෙරෙහි අවධානය යොමු කරමින් සම්බන්ධිත ආයතනවල ධාරිතාව තක්සේරු කිරීම හා විශ්ලේෂණය කිරීම මෙම පැවරුම මගින් සිදුවේ. එමගින් ඩිජිටල් උපදේශන සහ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිවලට අදාළ ආයතනික යාන්ත්‍රණ, ක්‍රියා පටිපාටි සහ භාවිතයන් සමාලෝචනය කරනු ඇත. මෙම අධ්‍යයනය මගින් උපදේශන සකස් කිරීම සහ විභව සහයෝගිතා ගවේෂණය කිරීම සඳහා අදාළ ආයතන තුළ පවතින ඩිජිටල් පද්ධති සහ ඒ ආශ්‍රිත දත්ත පද්ධතිවල ධාරිතාව ඇගයීමට ලක් කරනු ඇත. මීට අමතරව, එමගින් තීරණ ගන්නන්ගේ ප්‍රවේශය, අර්ථ නිරූපණය, ප්‍රතිචාරය සහ ද්වි-මාර්ග අන්තර්ක්‍රියා

ඇතුළුව තොරතුරු ප්‍රවාහය, තොරතුරු රැස් කිරීම, සකස්කිරීම සහ බෙදහැරීමේ ස්ථාන, තොරතුරු සම්ප්‍රේෂණ මාර්ග සහ ක්‍රම පිළිබඳ සමාලෝචනය කරනු ඇත.

තවද, මෙම අධ්‍යයනය මගින් තාක්ෂණික ආයතන සහ බලධාරීන්ගෙන් කාලගුණය, කෘෂිකාර්මික කාලගුණික තත්ත්වයන් සහ ආපදා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ තොරතුරු ලබා දෙන වත්මන් ඩිජිටල් නිෂ්පාදන තරයේ සමාලෝචනය කර ඇගයීමට ලක් කරනු ලැබේ. මෙයට විවිධ කෙටි කාලීන සහ දිගු කාලීන කාලගුණ අනාවැකි, අයහපත් කාලගුණික සිදුවීම් සම්බන්ධ උපදේශන, සෘතුමය සහ මාසික කෘෂි කාලගුණ විද්‍යා උපදේශන, පූර්ව ඇඟවීම්, ගංවතුර/නියඟය සහ වෙනත් ආපදා පූර්ව අනතුරු ඇඟවීම් සහ අදාළ පණිවිඩ ඇතුළත් වේ.

<u>අම්පාර දිස්ත්‍රික්කයේ යෝජිත ගල්ගෙකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය සඳහා මූලික පාරිසරික පරීක්ෂාව (IEE)</u>

ජලාශ සහ වැව් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කෘෂිකාර්මික ජීවනෝපාය සම්බන්ධයෙන් ඉතා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. රටේ ආර්ථිකය සහ ප්‍රජාවන් වාරි කෘෂිකර්මාන්තය මත දැඩි ලෙස රඳා පවතින අතර ගෘහස්ථ සහ කෘෂිකාර්මික ජල සැපයුම විශ්වාසදායක සහ ප්‍රමාණවත් ජල මූලාශ්‍ර මත රඳා පවතී. ජලය ගබඩාකර තබාගැනීම, බෙදාහැරීම සහ වාරිමාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු කිරීම සංවර්ධන න්‍යාය පත්‍රවල ප්‍රධාන ප්‍රමුඛතාවයක් වී ඇත. යෝජිත ගල්ගෙකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ජාතික සහ ආංශික ප්‍රමුඛතාවලට අනුකූලව සිදුවන අතර, ජීවනෝපායන් සහ ප්‍රජා යහපැවැත්ම සඳහා උපකාරීවනු පිණිස ග්‍රාමීය ප්‍රදේශවල වාරි ජලය ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව ඉහළ නැංවීම අරමුණු කර ගෙන ඇත. මෙම ප්‍රදේශ සහ වාරි ජලය මත යැපෙන ගොවි ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වාරිමාර්ග කෘෂිකාර්මික පද්ධති වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය වේ.

ගමේ ජලාශ යනු හුදෙක් ජලය ගබඩා කර තැබීම සඳහා වෙන්වුන ප්‍රදේශ පමණක් නොව ඒවා විශේෂයෙන් වියළි කලාපවල ප්‍රජාවගේ සමාජ-සංස්කෘතික හා ආර්ථික වියමනේ අත්‍යවශ්‍ය අංගයකි. මෙම ජලාශ ගංවතුර සහ නියඟ ආපදා අවදානම අවම කිරීම, ජෛව විවිධත්වය සඳහා වාසස්ථාන සැපයීම සහ ක්ෂුද්‍ර දේශගුණික නියාමනය ඇතුළු පුළුල් පරාසයක පරිසර පද්ධති සේවා සපයන ජලජ පරිසර පද්ධති ලෙස ක්‍රියා කරයි. එම ජලාශ ගෘහස්ථ හා සනීපාරක්ෂක ජල භාවිතය සඳහා ද ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ පිහිටි අම්පාර දිස්ත්‍රික්කය තුළ දශක තුනකට අධික කාලයක් පැවැති ගැටුම් හේතුවෙන් දැඩි ලෙස පීඩාවට ලක්වූ ප්‍රදේශ ඇත. භූගෝලීය තත්ත්වයන් හේතුවෙන් පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය දිවයිනේ අඩුම සංවර්ධනයක් සහිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත. වාරිමාර්ග, ගෘහස්ථ සහ කාර්මික අරමුණු සඳහා අවශ්‍ය ජලයේ පවතින හිඟය ප්‍රදේශයේ සංවර්ධනයට ප්‍රධාන බාධාවකි. කෘෂිකර්මාන්තය, විශේෂයෙන්ම වී වගාව මෙම ප්‍රදේශවල ප්‍රධාන ජීවනෝපාය වන අතර මෙහි වෙසෙන ප්‍රජාවගේ ජීවිතය පවත්නා ජල ප්‍රමාණය හා ප්‍රවේශය මත බෙහෙවින් රඳා පවතී. සීමිත වර්ෂාපතනයක් ලැබීම හේතුවෙන් ප්‍රදේශයේ වැසි ජලය මත පදනම් වූ කෘෂිකර්මාන්තය සැප්තැම්බර් සිට අප්‍රේල් දක්වා "මහ" කන්නයට සීමා වේ. "යල" කන්නයේදී වාරි ජලය නොමැතිකම හේතුවෙන් වගා කරනු ලබන්නේ සැලකිය යුතු තරම් අඩු බිම් ප්‍රමාණයකි. මෙවන් පසුබිමක් තුළ, තිරසාර කෘෂිකර්මාන්තය සඳහා ග්‍රාමීය ජලාශ සහ ඒ ආශ්‍රිත වාරි යටිතල පහසුකම් අත්‍යවශ්‍යය.

ප්‍රමාණවත් වර්ෂාපතනයෙන් හා වාරිමාර්ග යටිතල පහසුකම් නොමැතිව පීඩා විඳින පදියතලාව ප්‍රදේශයේ ජනතාව වෙත විශ්වාසනීය ජල සැපයුමක් සහතික කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගල්ගෙකණ්ඩිය ජලාශ ව්‍යාපෘතිය යෝජනා කරයි. මෙම ව්‍යාපෘතිය මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණියේ ගල්ඔඩයි උප ද්‍රෝණියේ පිහිටා ඇත. මෙයට ජලාශයක්, අමුණක් සහ කෘෂිකාර්මික ක්ෂේත්‍රවලට ජලය ගබඩා කරතබා බෙදා හැරීම සඳහා සැලසුම් කර ඇති ඇළ මාර්ග පද්ධතියක් ඇතුළත් වේ. පවත්නා පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා වැඩිදියුණු කරන ලද මෙහෙයුම් සහ නඩත්තු යාන්ත්‍රණ හඳුන්වා දෙනු ලැබේ.





ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } IWM/B/MCB/01/22/05

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 දෙසැම්බර්30 දින

වාරිමාර්ග අමාත්‍යාංශය
09 JAN 2024
ලේඛණ කාර්යාලය
500, ටී.බී. ජයා මාවත,
කොළඹ 10.
56

16/01/2024
12.20 pm.

සභාපති,
සී/ස මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්) සමාගම.

සී/ස මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්) සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත් -:

01. ලේකම් - වාරිමාර්ග අමාත්‍යාංශය
02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. IWM/B/MCB/01/22/05

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 දෙසැම්බර් 20 දින

සභාපති,

සීමාසහිත මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්) සමාගම.

සීමාසහිත මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්ත්වාගණනය කළ මතය

සී/ස මහවැලි කන්සල්ටන්සි බියුරෝ (පුද්ගලික) සමාගමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ නත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තක්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 11.21 ඡේදය ප්‍රකාරව මූල්‍ය වත්කම්වල හානිකරණයක් සිදුව ඇත්නම් ඒ සඳහා හානිකරණ අලාභ හඳුනා ගැනීම සිදුකළ යුතුවේ. එසේ වුවද, රු.12,627,290 ක් වූ ලැබිය යුතු ශේෂ තුළ රු.5,703,194 ක් වූ වසර 05 ඉක්මවූ ශේෂ පැවතියදී එහි බොල් ණය ඇතිවීමේ හැකියාව තක්සේරු කර හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 17.19 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.14,343,803 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 51 ක් සමාගම අඛණ්ඩව ප්‍රයෝජනයට ගෙන තිබුණද, ඒවායේ සාධාරණ වටිනාකම් ඉදිරිපත් කිරීම සඳහා වත්කම්වල ඵලදායී ජීවිත කාලය හා සුන්බුන් වටිනාකම් නැවත තක්සේරු කර නොතිබුණි.

(ඇ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතියේ 29.2 ඡේදය අනුව සමාගමට අදාළ ආදායම් බදු වියදම් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) වර්ෂ 10 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකරන ලද රු.611,866 ක බදු වගකීමක් පැවති අතර, එහි පැවැත්ම පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබුණු වර්ෂ 5 ඉක්මවා ඇති රු.5,703,194 වූ ශේෂ 9 ක්, වර්ෂ 03 ඉක්මවූ රු.3,135,933 ක් වූ ශේෂ 03 ක් සම්බන්ධයෙන් ශේෂ සනාථන හෝ අනෙකුත් සාක්ෂි ඉදිරිපත් නොකළ අතර, ඒවා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් අය විය යුතු ශේෂයක් ලෙස රු.1,319,471ක් දක්වා තිබුණද ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල සමාගමට ගෙවිය යුතු ශේෂ කිසිවක් දක්වා නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන සමාගමේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාලව, මගේ වගකීම වන්නේ ඉහත සඳහනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී මෙහි වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අතුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත් නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළයුතුය. නවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම් ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ආවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු

කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් කැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නනී හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරනා ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකැසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීභාවය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරීක්ෂාවන් සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වූවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්ව ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තක්ස්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය

සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ නක්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති 1.2 (අ),(ආ), (ඒ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ආ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාගාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික නත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඒ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද චෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/විධිවිධානයට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ 387	වෙක්පත් මගින් ගෙවීම් කිරීමේදී බැංකු ශේෂය ප්‍රමාණවත් බවට තහවුරු කරගත යුතු අතර කිසිම ආණ්ඩුවේ බැංකු ගිණුමකින් අයිරා ගැනීම් නොකළ යුතුය. එසේ වුවද 2022 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, ජූනි, ජූලි හා අගෝස්තු මාසවල සමාගමේ මූදල් පොතේ පිළිවෙලින් රු.243,194 ක, රු.68,024 ක, රු.215,580 ක, රු.215,580 ක හා රු.215,580 ක ඍණ ශේෂයන් පැවතුණි.

6

(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති රජයට අයත් ආයතනවල සංයුක්ත පාලනය සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහය	
	(i) 2.2.2 (අ) ඡේදය	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් අවම වශයෙන් මසකට වරක්වත් අධ්‍යක්ෂ මණ්ඩලය රැස් කිරීමට කටයුතු කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 01 ක් පමණක් පවත්වා තිබුණි.
	(ii) 4.2 ඡේදය	විගණන කමිටුවක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වාදී ඇති මෙහෙයුම් අත්පොත	
	(i) 3.2 ඡේදය	සියළුම රාජ්‍ය ව්‍යාපාර කාර්ය මණ්ඩලය, බදවා ගැනීම් පරිපාටිය හා ගෙවීම් ව්‍යුහය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අනුමැතිය සඳහා යැවිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
	(ii) 6.6 ඡේදය	වාර්ෂික වාර්තාව නිෂ්පාදන වර්ෂය අවසන් වී මාස 05ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් සමාගම විසින් 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර සමාගමේ සම්පත් යහපුරුදු ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රයෝජනය කර භාවිතා කර නොමැති බව.

කණේවෙල අමුණ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා මිලදී ගෙන ඉතිරිව තිබූ යකඩ තොගය වෙන්ඩර් ක්‍රියාමාර්ග අනුගමනය කර අපහරණය කරන ලෙසට 2021 මැයි 18 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙදී උපදෙස් ලබා දී තිබුණද, ඒ අනුව කටයුතු නොකර වාරිමාර්ග අමාත්‍යාංශයට එම තොගය රු.2,265,994 ක ප්‍රතිශ්‍යාචකට විකුණා තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 13(18) වගන්තිය ප්‍රකාරව අනුබද්ධිත සමාගමක් ලෙස පිහිටුවන ලද සී/ස මහවැලි කන්සල්ටන්සි සීයුමේර් (පුද්ගලික) සමාගමේ පවතින සියළු මූල්‍ය හා මෙනෙහික වත්කම්, ඛැරකම් හා කාර්ය මණ්ඩලය මෙන්ම ගිවිසුම්ගතව ඇති උපදේශන සේවාවන් සහ ඔදුකරන සියළු ක්‍රියාකාරකම්ද යම්හ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට පැවරීමට 2019 ඔක්තෝබර් 30 දිනැති අංක අමප/19/2770/104/083 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව, 2020 දෙසැම්බර් 30 දින රු.10 බැගින් කොටස් 6385 ක් වූ රු.63,850ක කොටස් ප්‍රාග්ධනය වාරිමාර්ග අමාත්‍යාංශයට පවරා තිබුණි. එසේ වුවද අයිතිය පැවරීම පිළිබඳ තොරතුරු යාවත්කාලීන නොකර සමාගම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පාලිත සමාගමක් බවත් ඉක්මනින් වාරිමාර්ග අමාත්‍යාංශය යටතට පත් කිරීමට කටයුතු කරන බවත් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපත්ති හා සටහන් අංක 3.2.3 හි දක්වා තිබුණි.

(ආ) අවමය 2 ක් හා උපරිමය 7 ක් වන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සම්බන්ධයෙන් නිශ්චිත විධිවිධාන සාංගමික වගාවස්ථාවලියේ දක්වා නොතිබුණි. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ සිවිල් ඉංජිනේරුවරයකු ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පත් කර තිබුණු වාරිමාර්ග අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (තාක්ෂණ විගණන) තනතුර දරන නිලධාරියා සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියා සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කර තිබුණි. අදාළ ප්‍රධාන විධායක නිලධාරියා වෙත නිකුත් කර තිබූ පත්වීම් ලිපිය අනුව

නිලධාරියාගේ පත්වීම පූර්ණකාලීනද අර්ධකාලීනද යන්න පැහැදිලිව දක්වා නොතිබුණු අතර ඔහුගේ දීමනාව ලෙස 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛයේ සඳහන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරකට හිමි රු.98,215 ක වැටුප හා වර්ෂ 05කට අදාල රු.13,500ක වැටුප් වර්ධක ඇතුළත් වැටුපෙන් අඩක් හා අනෙකුත් දීමනාද ඇතුළත් වන පරිදි රු.52,342ක් බැගින් භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව ගෙවා තිබුණි. මෙකී දීමනා ලෙස 2023 ඔක්තෝබර් 31 දක්වා එකතුව රු.1,977,355 ක් ගෙවා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) වශයෙන් කටයුතු කළ නිලධාරිනිය සමාගමේ ලේකම්/නීති නිලධාරී තනතුර සඳහා පත්කර තිබුණද අදාළ නිලධාරිනිය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් නිදහස් කර නොතිබුණු අතර පත්වීම් ලිපියේ පත් වීමේ ස්වභාවය, දීමනා ගෙවන ආකාරය හා අනෙකුත් පත්වීම කොන්දේසි දක්වා නොතිබුණි. 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා වක්‍රලේඛය ප්‍රකාරව උක්ත තනතුර සඳහා අදාල වන රු.55,925 ක වැටුප හා රු.6,875 ක් වූ වර්ෂ 05 ක වැටුප් වර්ධක යන ඒවායේ එකතුවෙන් අඩක් හා අනෙකුත් දීමනා ඇතුළත් වන පරිදි රු.33,700 ක් බැගින් වූ දීමනාවක් භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව මාසිකව ගෙවා තිබුණි.

(ඈ) භාරගත් කාර්යයන් නිමකර දී තිබුණු ආයතන තුනකින් ලැබිය යුතු එකතුව රු.2,898,733 ක් වූ කොන්ත්‍රාත් රැඳවුම් මුදල් කාලීනව අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) උපදේශන ව්‍යාපෘතියක් සඳහා 2022 දෙසැම්බර් 30 දින රු.2,846,300 කට ලබා දී ගත් ලැප්ටොප් පරිගණක 07 ක් 2023 මැයි 02 දින සමාගමේ උපදේශකවරුන් වෙත ලබා දී ඇති බව දක්වා තිබුණද, ඒවා විධිමත් පරිදි භාරදීමට හා භාණ්ඩ සම්ක්ෂණය මගින් පැවැත්ම තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද උපදේශන කාර්යයන් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) වාරිමාර්ග අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත ගිං නිල්වලා හැරවුම් ව්‍යාපෘතියට අදාළව පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාවක් පිළියෙල කිරීමේ උපදේශන කාර්යය එම අමාත්‍යාංශය විසින් 2017 අප්‍රේල් 28 දින සමාගම වෙත පිරිනමා තිබූ අතර අදාළ කාර්යය මාස 09ක් තුළ නිම කළයුතු වුවත් විගණික දින වූ 2023 ජූලි 17 දක්වා එම කාර්යය නිම කිරීමට නොහැකිවී තිබුණි. අමාත්‍යාංශය සමඟ වූ ගිවිසුමෙහි 2.6 වගන්තිය ප්‍රකාරව ගිවිසුමෙහි සිදුකරන වෙනස්කම් සම්බන්ධව

සේවාදායකගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු වුවද සමාගම සමඟ ගිවිසුම් ගත වූ උපදේශකවරුන් 2021 ජූලි 20 දින සිට ඉවත්ව ගොස් නව උපදේශකවරුන් 7ක් පත්කර ගැනීමේදී ඒ සඳහා සේවායෝජකයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිත යටිමහන ජලාශ ව්‍යාපෘතියට අදාළව පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාවක් පිලියෙල කිරීමේ උපදේශන කාර්යය 2021 මාර්තු 01 දින රු.6,147,555 මුදලකට සමාගම වෙත පිරිනමා තිබූ අතර ගිවිසුම අනුව අදාළ කාර්යය 2021 අගෝස්තු 27 දින නිම කළ යුතු වුවත් විගණිත දින වූ 2023 ජූලි 17 දක්වාම නිම කර නොතිබුණි. කෙටුම්පත් වාර්තාවට ඇතුළත් ව නොමැති කරුණු 08ක් ඇතුළත් කර අතිරේක වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස සේවායෝජක විසින් දන්වා තිබුණද, විගණිත දින වූ 2023 ජූලි 17 දක්වා එම අතිරේක වාර්තාව ඉදිරිපත් කරද නොතිබුණි. කොන්ත්‍රාත්තුව නිම කිරීම සඳහා දින 491ක කාල දිගුවක් සේවායෝජක විසින් සමාගමට ලබා දී තිබුණද, සමාගම උපදේශකවරුන්ට ලබා දී තිබුණු වසර එකහමාරක වලංගු කාලය සුදුසු පරිදි දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) සමාගම 2017 වර්ෂයේදී මොරගහකන්ද සංචාරක බංගලාව සහ නැරඹුම් මැදිරියේ ඉදිකිරීම් වෙනුවෙන් උප කොන්ත්‍රාත් ලබාදී තිබූ අතර, ඊට අදාල අතුරු ගෙවීම් සිදුකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කිරීම නිසා සමාගමට රු.20,200,000 ක පාඩුවක් සිදුව තිබුණි. 2019 පෙබරවාරි 21 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා මාසයක් තුළ කාරක සභාවට වාර්තා කළ යුතු බව නිර්දේශ කර තිබුණද, එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණු අතර විගණිත දිනය වූ 2023 ජූලි 17 දක්වා අදාළ පාඩුව අයකරගැනීම සඳහා වන නෛතික ක්‍රියාමාර්ගද ආරම්භ කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.ඩී.චිත්‍රමරත්න
විගණකාධිපති

මහවැලි උපදේශක සේවා (පුද්ගලික)කාර්යාංශයේ

2022 දෙසැම්බර් **31** න් අවසන් වූ වසර සඳහා

මූල්‍ය ප්‍රකාශනය

පටුන

පිටුව

- මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය **22**
- ලාභ අලාභ ප්‍රකාශනය **23**
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය **24**
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය **25**
- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති **26-33**
- ගිණුම් පිළිබඳ සටහන් **34-39**

සීමා සහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශයේ
2022 දෙසැම්බර් 31 වන විට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	01	4,671,260	1,089,414
ආයෝජන	02	38,500,000	43,500,000
හවුල් ව්‍යාපාර හයිලන්ඩ්		100,000	1,000,000
මුළු ජංගම නොවන වත්කම්		43,271,260	44,689,414
බැංකු ඇප		1,165,627	376,513
ජංගම වත්කම්			
ද්‍රව්‍ය තොග - කනේවෙල		-	1,412,685
වෙළඳ සහ අනෙකුත් ලැබියයුතු	03	12,627,290	8,959,568
ආදායම්බදු ගෙවීම්	04	2,734,001	2,824,449
මොරගහකන්ද CB/VC උපකොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබියයුතු		20,200,000	20,200,000
ගෙවීම් සහ තැන්පතු	05	21,060	109,532
මුදල් සහ මුදල් සමාන දෑ	06	6,955,828	2,165,527
මුළු ජංගම වත්කම්		42,518,178	35,671,732
මුළු වත්කම්		86,975,066	80,737,659
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධන සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	07	63,850	63,850
පොදු සංචිත		48,288,411	48,288,411
අයහාර සංචිත		27,606,107	21,398,635
මුළු හිමිකම්		75,958,368	69,750,896
ජංගම නොවන වගකීම්			
විලම්භිත බදු		611,866	611,866
මුළු ජංගම නොවන වගකීම්		611,866	611,866
ජංගම වගකීම්			
වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු	08	8,125,039	6,793,076
පාරිතෝෂික ප්‍රතිපාදන	09	2,275,862	2,988,055
බැංකු අයිරා	10	3,932	593,765
මුළු ජංගම වගකීම්		10,404,833	10,374,897
මුළු හිමිකම් සහ වගකීම්		86,975,066	80,737,659

වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ
මෙහි පිටු අංක 05 සිට 13 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනවල අවියෝජනීය අංගයක් නිර්මාණය කරයි.
මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ නියමයන්ට අනුකූලව පිළියෙළ කර ඇත.

අත්/කළේ:තරංග එදිරිසිංහ
ගණකාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.
සීමා සහිත මහවැලි උපදේශක සේවා (පුද්.) කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සහ සඳහා අත්සන් කරනු ලැබුවේ.

අත්/කළේ :යූ.ඩී.සී. ජයලාල්
සභාපති
කොළඹ
07/06/2023

අත්/කළේ :චන්දන එදිරිසූරිය
ප්‍රධාන විධායක නිලධාරී
සීමාසහිත මහවැලි උපදේශක සේවා (පුද්.) කාර්යාංශය
වාරිමාර්ග අමාත්‍යාංශය

සීමා සහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශයේ
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම ප්‍රකාශය

	සටහන	2022 රු	2021 රු.
ආදායම	**11**	31,287,011	9,526,584
සේවා පිරිවැය	**12**	(11,861,031)	(2,368,450)
දළ ලාභය හෝ පාඩුව		**19,425,980**	**7,158,134**
පරිපාලන වියදම්	**13**	(17,692,302)	(16,781,308)
මෙහෙයුම් ලාභය / (අලාභය)		**1,733,678**	**(9,623,174)**
මෙහෙයුම් නොවන ආදායම	**14**	4,893,172	2,418,575
මූල්‍ය පිරිවැය	**15**	(196,286)	(79,606)
බදු පෙර ලාභය / (අලාභය)		**6,430,563**	**(7,284,205)**
ආදායම් බදු		-	
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / (අලාභය)		**6,430,563**	**(7,284,205)**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි
ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අවියෝජනීය අංගයක් නිර්මාණය කරයි.

සීමා සහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශයේ
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

	සටහන	ප්‍රකාශිත ප්‍රාග්ධනය	පොදු සංචිත	අයභාර සංචිත	මුළු හිමිකම්
		රු.	රු.	රු.	රු.
2021 ජනවාරි 1 වන දිනට		63,850	48,288,411	29,147,255	**77,499,516**
වසර සඳහා ලාභය හෝ අලාභය		-	-	(7,284,205)	**(7,284,205)**
පූර්ව කාල ගැලපීම				(464,416)	**(464,416)**
2021 දෙසැම්බර් 31 දිනට		**63,850**	**48,288,411**	**21,398,635**	**69,750,896**
2022 ජනවාරි 1 වන දිනට ශේෂය		63,850	48,288,411	21,398,635	**69,750,896**
				-	
වසර සඳහා ලාභය හෝ අලාභය		-	-	6,430,563	**6,430,563**
පූර්ව කාල ගැලපීම	**16**			(223,091)	**(223,091)**
2022 දෙසැම්බර් 31 දිනට		**63,850**	**48,288,411**	**27,605,107**	**75,958,368**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩු කිරීම් දක්වයි
පිටු 05 දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අවියෝජනීය අංගයක් නිර්මාණය කරයි.

සීමා සහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශයේ
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2022	2021
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
බදු ගෙවීමට පෙර ලාභය /(අලාභය)	**6,430,563**	**(7,284,205)**
ගැලපුම්;		
ක්ෂය වීම	455,704	1,209,211
පොලී ආදායම	(3,688,373)	(2,418,575)
පොලී වියදම	196,286	79,606
පූර්ව කාල ගැලපුම්	(223,091)	(464,416)
ද්‍රව්‍ය තොග අපහරණය කිරීමෙන් ලාභය	(828,559)	-
පාරිතෝෂික ප්‍රතිපාදන	282,773	321,025
කාරක ප්‍රාග්ධන වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය/අලාභය	**2,625,304**	**(8,557,354)**
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
තැන්පතු සහ ලැබිය යුතු මුදල් වැඩිවීම/(අඩු වීම).	(3,488,833)	7,266,310
වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් වැඩිවීම/(අඩුවීම).	1,331,962	(6,550,417)
මෙහෙයුම්වලින් උත්පාධිත මුදල්	**468,433**	**(7,841,461)**
ගෙවන ලද පොලී	(196,286)	(79,606)
ගෙවන ලද පාරිතෝෂික	(994,967)	(161,833)
මෙහෙයුම් කටයුතුවලින් ජනිත/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්	**(722,819)**	**(8,082,900)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
ආයෝජන	5,000,000	4,212,663
ලැබුණු පොලී ආදායම	3,688,373	2,418,575
ද්‍රව්‍ය තොග විකිණීම	2,241,244	
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(4,037,550)	-
ආයෝජන කටයුතු සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්	**6,892,067**	**6,631,238**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය		
බැංකු ඇපකරය	(789,114)	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල්	**(789,114)**	-
මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම /(අඩුවීම)	5,380,134	(1,451,663)
වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	1,571,762	3,023,425
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**6,951,895**	**1,571,762**

සීමා සහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශයේ

2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. වාර්තාකරණ අස්තිත්වය

මහවැලි උපදේශක කාර්යාංශය (පෞද්ගලික) සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ සඳහන් විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සහ පිහිටි වගකීමෙන් සීමිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ. 05 ජාවත්ත පාරේ අංක 11 දරන ස්ථානයේ පිහිටා ඇත.

1.1 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගම වාරිමාර්ග අමාත්‍යාංශයට උපදේශන සේවා සැපයීමේ කාර්යයේ නිරතව සිටී

2 සකස් කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ලාභ හා අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා සම්මත කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය මෙන්ම 2007 අංක 07 දරන සමාගම් පනත සහ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා විගණන ප්‍රමිති පනතේ නියමයන් අනුව මෙම ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කර ඇත. මුදල් ප්‍රවාහ තොරතුරු හැර, මෙම මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම භාවිතා කරමින් සකස් කර ඇත.

2.2 මූල්‍ය ප්‍රකාශනය අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කිරීම

සමාගමේ මූල්‍ය ප්‍රකාශනය නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අවසර ලබා දී ඇත.

2.3 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත.

2.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශන සමාගමේ ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. අන් ආකාරයකින් ප්‍රකාශ කර නොමැති නම් මිස, ශ්‍රී ලංකා රුපියල් වලින් පෙන්වන සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

3. වැදගත්භාවය සහ සමූහනය

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයක් ඇති අයිතම වැදගත් නොවන්නේ නම් මිස, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1: මූල්ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම් අනුව අවසර ලබා දී ඇති පරිදි වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.
හඳුනාගත් මුදල් ප්‍රමාණයන් පියවීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් සමගාමීව උපලබ්ධි කිරීමට සහ පියවීමට අභිප්‍රායක් ඇති විට පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ මුදල මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ වාර්තා කරනු ලැබේ.

3.1 අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගට අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරු කර ඇති අතර ඔවුන් සමාගම ඈවර කිරීමට හෝ වෙළඳ තටයුතු නැවැත්වීමට අදහස් නොකරයි.
එසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ පවත්නා අරමුදල් ප්‍රභවයන් පිළිබඳව තක්සේරු කර ඇති අතර, අපේක්ෂිත අනාගත කාලයක් සඳහා සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකියාව පවතින බව තරයේ විශ්වාස කරන බැවින් මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව පැවැත්ම පිළිබඳ පදනම මත සකස් කර ඇත.

3.2 සාධාරණ අගය තීරණය කිරීම

'සාධාරණ අගය' යනු වත්කමක් විකිණීමට ලැබෙන හෝ මිනුම්කරණ දිනයේ ප්‍රධාන වශයෙන් සහභාගී වූ වෙළඳපල හෝ එවැන්නක් නොමැති විට, එම දිනයේ සමාගමට ප්‍රවේශවිය හැකි වඩාත්ම වාසිදායක වෙළඳපල අතර සිදුවූ ක්‍රමවත් ගනුදෙනුවකදී වගකීමක් පැවරීම සඳහා ගෙවනු ලබන මිල වේ.

වගකීමක සාධාරණ අගය එහි කාර්ය සාධනය නොවන අවදානම පිළිබිඹු කරයි. සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ හෙළිදරව් කිරීම් කිහිපයක් මගින් මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් යන දෙකටම සාධාරණ අගයක් තීරණය කිරීමට නියම කරයි.

3.3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

සඳහන් කර ඇති වෙනස්කම් හැර පහත දක්වා ඇති සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා සංගතව යොදාගෙන ඇත.

3.4 වත්කම් සහ ඒවායේ තක්සේරු කිරීමේ පදනම

සමාගම සතු මුදල්, බැංකු ශේෂයන් සහ සමාගමේ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ වාර්තා කළ දින සිට වසරක් ඇතුළත යන අවස්ථාවලින් කළින් එළැඹී අවස්ථාවේ දී මුදල් වශයෙන් උපලබ්ධි වේ යැයි අපේක්ෂිත දෑ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් යනු වාර්තා කළ දින සිට වසරක කාල සීමාවකින් ඔබ්බට සමාගම රඳවා තබා ගැනීමට අදහස් කරන ඒවා වේ.

3.1.1 දේපල, පිරියත සහ උපකරණ

3.1.1.1 හඳුනා ගැනීම සහ මිණුම් කිරීම

දේපල, පිරියත සහ උපකරණ පිරිවැය හෝ සමුච්චිත ක්ෂය අඩුකරන ලද අගයට දක්වනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය යනු වත්කම් අත්පත් කර ගැනීමේ හෝ ඉදිකිරීම සඳහා සහ වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා එහි ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමේදී දරන ඕනෑම වියදමකි.

වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය පුරා ප්‍රතිපාදිත මුදල් කපා හැරීම පිණිස, සියලු දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තක්සේරුව අනුව සරල මාර්ග ක්‍රමය භාවිතා කරමින් ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

3.1.1.2 **පසුකාලීන පිරිවැය**

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක කිසියම් අංගයක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එකී කොටසේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් අයිතමයේ ධාරණ අගයට හඳුනාගනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා අදාළ වන පිරිවැය දැරූ පරිදි ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

3.1.1.3 **ක්ෂයවීම්**

වත්කම්වල පිරිවැය වන ක්ෂය කළ හැකි මුදල හෝ අවශේෂ අගය අඩුකරන ලද පිරිවැය සඳහා ආදේශකයක් වන මුදල මත ක්ෂයවීම් ගණනය කරනු ලැබේ. වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පරිභෝජන රටාව වඩාත් සමීපව පිළිබිඹු කරන බැවින්, දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවල එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්ෂයවීම් ලාභ හෝ අලාභය සරල මාර්ග පදනමින් හඳුනා ගැනේ.

ප්‍රවර්තන සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේදවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ.

වත්කම් කාණ්ඩය	වසර ගණන	අනුපාතය %
කාර්යාල උපකරණ	8	12.5
ගෘහ භාණ්ඩ සහ සවිකෘත	8	12.5
පිරියත සහ යන්ත්‍රෝපකරණ	8	12.5
පරිගණක මෘදුකාංග	8	12.5
වායු සමීකරණ	8	12.5
රසායනාගාර උපකරණ	8	12.5
විවිධ උපකරණ	8	12.5
ජල ටැංකිය සහ පොම්පය	8	12.5
සමීක්ෂණ උපකරණ	8	12.5
මෝටර් රථ	8	12.5

කිසියම් වත්කමක් භාවිතයට සඳහා තබා ඇති අවස්ථාවේ සිට එහි ක්ෂය වීම ආරම්භ වන අතර වත්කම විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කළ දිනය සහ වත්කම හඳුනා නොගන්නා දිනය යන දින අතරින් කලින් එළැඹි දිනයේදී ක්ෂය වීම් නතර වේ.

ක්ෂයවීම් ක්‍රමය, ප්‍රයෝජනවත් ජීවිත සහ අවශේෂ අගයන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ සමාලෝචනය කරන අතර සුදුසු නම් ගැළපීම් කරනු ලැබේ.

3.1.1.4 හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක ධාරණ අගය එම අයිතමය බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ අපහරණය කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හෝ හඳුනා නොගනී.

දේපල, පිරියත සහ උපකරණවල අයිතමයක් අපහරණය කිරීමේදී ලැබෙන ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ දේපල දේපල, පිරියත සහ උපකරණවල ධාරණ අගය සමඟ ලැබෙන ආදායම සංසන්දනය කිරීමෙනි. මෙය වෙනත් ආදායමක් තුළ ශුද්ධ ලෙස හඳුනාගෙන ප්‍රත්‍යාගණන අතිරික්ත සංචිතය රඳවාගත් ඉපැයීම් වලට මාරු කරනු ලැබේ.

3.1.2 ගබඩා භාණ්ඩ

ද්‍රව්‍ය තොගය - කනේවෙල

ගබඩා භාණ්ඩ අවම පිරිවැය අගයෙන් සහ ශුද්ධ උපලබ්ධි අගයෙන් මනිනු ලබයි. ගබඩා භාණ්ඩ මිල දී ගැනීමේ පිරිවැය යන්නට, මිලදී ගැනීමේ පිරිවැය, පරිවර්තනය කිරීමේ පිරිවැය සහ ගබඩා භාණ්ඩ ඒවායේ වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් පිරිවැය ඇතුළත් වේ. ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී ද්‍රව්‍ය තොගයේ අලාභවල ප්‍රමාණය සැලකිල්ලට ගනී. (සටහන අංක 14-අ)

3.1.3 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල්

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු මුදල් බොල් ණය සහ අවිනිශ්චිත ණය සඳහා ශුද්ධ ප්‍රතිපාදන උපලබ්ධි කිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදලට දක්වනු ලැබේ.

3.1.4 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යන්න මුදල් ශේෂය, ඇමතුම් තැන්පතු, ඉල්ලුම් තැන්පතු සහ දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා ඉල්ලුම මත ආපසු ගෙවිය යුතු බැංකු අයිරා වල ශුද්ධ වටිනාකම වෙනස් වීමේ සැලකිය යුතු තරම් වූ අවදානමකට භාජනය නොවන කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජනවලින් සමන්විත වේ.

3.1.5 බැරකම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වනුයේ ඉල්ලුම මත පියවිය යුතු හෝ මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරක් ඇතුළත පියවීමට නියමිත ගෙවීමය. ජංගම නොවන වගකීම් යනු මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරකට පසු ගෙවීමට නියමිත ශේෂයන් වේ. මෙම මුල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස, සමාගමට විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ වාස්තවික වගකීමක් පවතීනම්, සහ එම වගකීම පියවීම පිණිස ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය වෙනම් ප්‍රතිපාදන හඳුනා ගනී.

3.2.1 සේවක ප්‍රතිලාභ

3.2.1.1 නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල

නිශ්චිත දායක සැලැස්මක් යනු පශ්චාත් සේවානියුක්ති ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් විසින් වෙනත් ආයතනයකට ස්ථාවර දායක මුදල් ගෙවන අතර මෙහිදී වැඩිදුර මුදල් ගෙවීම සඳහා නෛතිකමය හෝ වාස්තවික බැඳීමක් නොමැත.

සමාගම විසින් සේවකයන්ගේ දළ වැටුපෙන් 12%ක ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක මුදල් ලෙස ගෙවීම් කරනු ලබයි. සියලුම සේවකයින් සේවක භාරකාර අරමුදල සඳහා සුදුසුකම් ලබන අතර, එම සේවකයින්ගේ දළ වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සමාගම විසින් දායක මුදල් ලෙස ගෙවනු ලබයි.

3.2.2 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂිතය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් නොවන වෙනත් පශ්චාත් සේවානියුක්ති ප්‍රතිලාභ සැලැස්මකි. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම යනු ආයුගණකකරුවෙකුගේ උපදෙස් අනුව වාර්තා කරන දිනයේ දී අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 - "සේවක ප්‍රතිලාභ පිරිවැය" ට අනුකූලව සියලුම සේවකයින් සඳහා සිය සේවයේ පළමු වර්ෂයේ සිට විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇති අතර එය සේවය ආරම්භ කළ දින සිට සෑම වසරකම සේවා කාලයක් තුළ වූ සෑම මාසයක් වෙනුවෙන් මාස භාගයක (1/2) වැටුප බැගින් ගණනය කරනු ලැබේ. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ, සේවකයකු සඳහා පාරිතෝෂික ගෙවීම පිණිස වගකීම පැන නගින්නේ අඛණ්ඩව වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි.

3.2.3 සාමාන්‍ය කොටස්

සාමාන්‍ය කොටස් නිකුතුව සඳහා සෘජුවම හේතුවන වර්ධක පිරිවැය හිමිකම්වලින් අඩු කිරීමක් ලෙස හඳුනාගැනේ. කොටස් ගනුදෙනුවක ගනුදෙනු පිරිවැයට අදාළ ආදායම් බද්ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 ට අනුකූලව ගිණුම්ගත කෙරේ.

සීමාසහිත මහවැලි උපදේශන සේවා (පුද්.) කාර්යාංශය 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරී පනත යටතේ සංස්ථාපිත වගකීමෙන් සීමිත සමාගමකි. එය රුපියල් 10 බැගින් වූ සාමාන්‍ය කොටස් ගණනකින් 6385කින් සමන්විත වේ. වර්තමානයේ එය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අනුබද්ධ සමාගමක් වන අතර එය නුදුරේදීම වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

3.3 ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ කාර්යයේදී වියදම් ක්‍රමයේ ක්‍රියාකාරීත්වය මගින් සමාගමේ ක්‍රියාකාරීත්වයේ මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර, එබැවින් එම ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම යන්නෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව අනුගමනය කරනු ලැබේ.

3.3.1 ආදායම

සමාගම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ආහැකි ප්‍රවනතාවයේ ප්‍රමාණයට සහ ගෙවීම් සිදු කරන්නේ කවදාද යන්න නොසලකා ආදායම විශ්වාසදායක ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. බදු හෝ තීරුබදු හැර ගිවිසුම්ගතව අර්ථ දක්වා ඇති ගෙවීම් කොන්දේසි සැලකිල්ලට ගනිමින් ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 15 යටතේ, කාර්ය සාධන වගකීම් ඉටුකිරීමේ ප්‍රමාණය මත ආදායම හඳුනා ගැනේ.

සේවා සැපයීම මගින් ලැබෙන ආදායම අදාළ සේවාව ලබා දෙන හෝ ඉටු කරන ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ හඳුනා ගැනේ.

3.3.2 වියදම් හඳුනාගැනීම

3.3.2.1 මෙහෙයුම් වියදම්

සමාගමේ දෛනික ක්‍රියාකාරකම්වලදී සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරනු ලබන සියලුම වියදම් වර්ෂයේ ලාභ/(අලාභ) ගණනය කිරීමේදී ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය වෙත ගිණුම්ගත කරනු ලැබේ.

මූල්‍ය නොවන වත්කම්, සෙමින් වලනය වන තොග, පමණ ඉක්මවා වැඩුණු තවාන්, දන්නා සියලු වගකීම් සම්බන්ධයෙන් හාණිකරණය සඳහා සහ දේපළ, පිරියත සහ උපකරණවල ක්ෂයවීම් සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

3.3.2.2 මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැය, බාහිර ණය ගැනීම් සහ සම්බන්ධිත පාර්ශ්ව ණය සහ මෙහෙයුම් කල්බදු යටතේ කරන ලද ගෙවීම් සඳහා වන පොලී වියදම්වලින් සමන්විත වේ. සුදුසුකම් ලබන වත්කමක් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම අදාළ නොවන ණය ගැනීමේ පිරිවැය ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගැනේ.

3.3.2.3 මුල්‍ය ආදායම

පොලී ආදායම ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් උපචිත පදනමක් මත හඳුනා ගැනේ.

3.3.2.4 ආදායම් බදු වියදම්

ආදායම් බදු වියදම් ප්‍රවර්තන සහ විලම්බිත බදුවලින් සමනිවිත වේ. ආදායම් බදු වියදම සෘජුවම හිමිකම් වශයෙන් හඳුනාගත් අයිතමවලට අදාළ වන ප්‍රමාණයට හැර ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගනු ලැබේ.

3.3.2.4.1 ප්‍රවර්තන බදු

පසුකාලීනව පනවන ලද නීති මගින් හෝ වාර්තා කරන දිනයවනවිට ප්‍රමාණවත් ලෙස පනවන ලද නීති මගින් සංශෝධිත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව ගණනය කරන ලද අදාළ තක්සේරු වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවන ලද හෝ ගෙවීමට අපේක්ෂා කරන මුදල් ප්‍රමාණයට අනුව වත්මන් සහ සංසන්ධනාත්මක කාලපරිච්ඡේදය සඳහා වන ප්‍රවර්තන බදු වියදම් ගණනය කරනු ලැබේ.

3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 'වක්‍ර ක්‍රමය' භාවිතා කරමින් සකස් කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී, ගෙවන ලද පොලී මෙහෙයුම් මුදල් ප්‍රවාහ ලෙසත්, ලැබූ පොලී සහ ලැබූ ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙසත්, ගෙවන ලද ලාභාංශ මූල්‍ය මුදල් ප්‍රවාහ ලෙසත් වර්ග කෙරේ.

3.5 වාර්තාකරණ කාල සීමාවෙන් පසුව සිදුවන සිදුවීම්

වාර්තාකරණ කාල සීමාවේ අවසානය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට බලය ලබා දී ඇති දිනය අතර කාල පරිච්ඡේදය තුළ සිදුවන වාසි සහගත සහ අවාසි සහගත සිදුවීම් වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිදුවීම් යනුවෙන් හඳුන්වනු ලැබේ. වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසුව සිදුවන සිදුවීම්වල වැදගත්භාවය පිළිබඳ සලකා බලනු ලබන අතර අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කරනු ලැබේ.

3.6 පූර්ව කාල ගැලපුම්

මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග හඳුනාගැනීම සහ මැනීම සම්බන්ධයෙන් සිදුවී ඇති දෝෂ, “ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ" යනුවෙන් සඳහන්වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කර ඇත.

සටහන - 01

දේපළ, පිරියත සහ උපකරණ

	2021.01.01 දිනට ශේෂය	වර්ෂය තුළ එකතුකිරීම්	වර්ෂය තුළ මාරුකිරීම්	වර්ෂය තුළ බැහැරකිරීම්	2022.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
කාර්යාල උපකරණ	751,552	1,191,250	-	-	1,942,802
කාර්යාල උපකරණ: කාර්යාල වෙන්කිරීම්	1,261,147	-	-	-	1,261,147
ගෘහ භාණ්ඩ සහ සවිකෘත	150,446	-	-	-	150,446
පිරියත සහ යන්ත්‍රෝපකරණ	1,890,771	-	-	-	1,890,771
පරිගණක සහ මෘදුකාංග	1,967,944	2,846,300	-	-	4,814,244
වායු සමීකරණ	302,009	-	-	-	302,009
විවිධ උපකරණ	627,964	-	-	-	627,964
ජල ටැංකිය සහ පොම්පය	43,076	-	-	-	43,076
සමීක්ෂණ උපකරණ	117,657	-	-	-	117,657
මෝටර් රථ	9,636,538	-	-	-	9,636,538
මුළු පිරිවැය / ප්‍රත්‍යාගණනය	**16,749,105**	**4,037,550**	-	-	**20,786,654**

සමුච්චිත ක්ෂයවීම්	2021.01.01 දිනට ශේෂය	වර්ෂය තුළ එකතුකිරීම්	වර්ෂය තුළ මාරුකිරීම්	වර්ෂය තුළ බැහැරකිරීම්	2022.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
කාර්යාල උපකරණ	607,675	61,264	-	-	668,939
කාර්යාල උපකරණ: කාර්යාල වෙන්කිරීම්	1,106,587	46,179	-	-	1,152,766
ගෘහ භාණ්ඩ සහ සවිකෘත	104,809	11,809	-	-	116,618
පිරියත සහ යන්ත්‍රෝපකරණ	1,890,771	-	-	-	1,890,771
පරිගණක සහ මෘදුකාංග	1,720,336	71,587	-	-	1,791,923
වායු සමීකරණ	270,558	22,200	-	-	292,759
විවිධ උපකරණ	352,838	78,375	-	-	431,213
ජල ටැංකිය සහ පොම්පය	30,054	-	-	-	30,054
මිනුම් උපකරණ	104,612	2,552	-	-	107,164
මෝටර් රථ	9,471,449	161,738	-	-	9,633,187
මුළු සමුච්චිත ක්ෂයවීම්	**15,659,689**	**455,704**	-	-	**16,115,394**
මුළු ලියාභල අගය	**1,089,416**	-	-	-	**4,671,260**

	2022	2021
	රු.	රු.
සටහන - 02		
ආයෝජන		
ස්ථාවර තැන්පතු- ලංකා බැංකුව 88128643	3,500,000	3,500,000
ස්ථාවර තැන්පතු- ලංකා බැංකුව 88128652	-	5,000,000
ස්ථාවර තැන්පතු- ලංකා බැංකුව 88128656	20,000,000	20,000,000
ස්ථාවර තැන්පතු- ලංකා බැංකුව 88128666	15,000,000	15,000,000
	38,500,000	**43,500,000**
සටහන - 03		
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු		
ලැබිය යුතු ආදායම් - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය	1,319,471	1,319,471
ලැබිය යුතු ආදායම් - වේලි ආරක්ෂණ	442,647	442,647
රඳවාගැනීම් - ජාවත්ත 2011/35	453,374	453,374
රඳවාගැනීම් - ජාවත්ත 2011/32	378,841	378,841
රඳවාගැනීම් - මඩාටුගම	1,273,787	1,273,787
රඳවාගැනීම් - කළු ගඟ - ප්‍රධාන වැඩ	5,557	5,557
රඳවාගැනීම් - සැලසුම් කාර්යාලය-මඩාටුගම	687,174	687,174
රඳවාගැනීම් - නියෝජ්ය ඇමති නිවහන	100,000	100,000
රඳවාගැනීම් -හිගුරක්ගොඩ	1,199,313	1,199,313
රඳවාගැනීම් -මැදිරිගිරිය	1,042,343	1,042,343
රඳවාගැනීම් -කනේවෙල අමුණ	419,422	419,422
ලැබිය යුතු ආදායම (සටහන 03- A)	1,517,198	897,075
ලැබිය යුතු පොලී ආදායම	3,734,164	390,534
ක්ෂේත්‍ර චාරිකා අත්තිකාරම්	30,000	350,000
උත්සව අත්තිකාරම්	24,000	-
	12,627,290	**8,959,538**
සටහන 03-A		
ලැබිය යුතු ආදායම		
තල්පිටිගල	-	897,075
ඩිජිටල් පද්ධති ව්‍යාපෘතිය	1,517,198	-
	1,517,198	**897,075**
සටහන 04		
ආදායම් බදු ආපසු ගෙවීම		
ආපසු ගෙවීම -ඉදිරියට ගෙන ආ	2,824,449	3,599,164
ඉල්ලුම් කළ හැකි ආර්ථික සේවා ගාස්තු	(90,448)	(774,715)
ආපසු ගෙවීම -ඉදිරියට රැගෙන ගිය	**2,734,001**	**2,824,449**
සටහන 05		
පෙරගෙවුම් සහ තැන්පතු		
ටෙන්ඩර් තැන්පතු (ආපසු ගෙවිය යුතු)	19,560	19,560
තැන්පතු - ඩයලොග් ටෙලිකොම්	1,500	1,500
පෙරගෙවුම්-අනුපාත	-	88,472
	21,060	**109,532**

	2022 Rs.	2021 Rs.
සටහන - 06		
මුදල් සහ මුදල් සමාන දෑ		
සම්පත් බැංකුව ජංගම ගිණුම් අංක : 003410000057	4,927,091	-
සම්පත් බැංකුව ජංගම ගිණුම් අංක : 103410000036	2,348	2,751
ඩීඑෆ්සීසී වර්ධන බැංකුව ඉ/ගි: 00107011461	1,219	1,219
ලංකා බැංකුව ජංගම ගිණුම් අංක: 73261242	1,955,028	2,067,416
ලංකා බැංකුව ජංගම ගිණුම් අංක : 0074676924	20,142	44,142
සුළු මුදල්	50,000	50,000
	6,955,828	**2,165,527**
සටහන - 07		
ප්‍රකාශිත ප්‍රාග්ධනය		
බලයලත් ප්‍රකාශිත ප්‍රාග්ධනය		
රු. 10 බැගින් වූ 5,000,000 ක සාමාන්‍ය කොටස්	50,000,000	50,000,000
	50,000,000	**50,000,000**
නිකුත් කරන ලද සහ සම්පූර්ණයෙන් ගෙවන ලද		
රු. 10 බැගින් වූ 6,385 ක සාමාන්‍ය කොටස්	63,850	63,850
	63,850	**63,850**
සටහන - 08		
වෙළඳ සහ අනෙකුත් ගෙවීයයුතු		
සේ.අ.අ. 20%	188,063	224,565
සේ.හා.අ. 3%	6,931	12,406
උ.ගෙවී. බද්ද	4,866	4,866
මුද්දර ගාස්තු	4,576	5,326
ජලය, විදුලිය සහ පිරිසිදු කිරීමේ ගාස්තු - ශ්‍රී.ලං.ම.අ.	164,236	1,432,713
ගෙවිය යුතු NSL	166,039	166,039
ගෙවිය යුතු දුරකථන ගාස්තු	13,483	25,427
ගෙවිය යුතු ජල ගාස්තු	4,550	10,000
වැඩ මූලික අත්තිකාරම් (සටහන 08 - A)	4,929,746	4,209,071
මුදල් ගෙවිය යුතු නිවාඩු	129,940	-
ප්‍රසාධ දීමනා ප්‍රතිපාදන	300,000	-
ගෙවිය යුතු වැටුප් සහ වේතන	149,778	149,778
ගෙවිය යුතු අතිකාල	8,577	28,227
ගෙවිය යුතු විගණන ගාස්තු	149,820	371,400
ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු	15,277	145,485
OE අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම	-	2,336
ගෙවිය යුතු කාර්ය මණ්ඩල පුද්ගලික ණය	-	5,440
ගෙවිය යුතු වෙනත් ගිණුම්	394,158	-
ගෙවිය යුතු උපදේශන ගාස්තු	1,495,000	-
	8,125,039	**6,793,079**

සීමා සහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශයේ
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර
සඳහා ගිණුම් පිළිබඳ සටහන්

	2022 Rs.	2021 Rs.
සටහන 08 - A		
වැඩ මූලික අත්තිකාරම්		
ගිං නිල්වලා	3,885,422	3,115,071
යාන් ඔය තිරසාර පාරිසරික බලපෑම් තක්සේරුව	318,200	318,200
යටිමහන පාරිසරික බලපෑම් තක්සේරුව	-	775,800
ගල්ගෙකණ්ඩිය	726,125	-
	4,929,746	**4,209,071**
සටහන- 09		
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන		
2021න් ඉදිරියට ගෙන ආ ශේෂය	2,988,055	2,828,864
වර්ෂය සඳහා ප්‍රතිපාදන	282,773	321,025
වසර සඳහා ගෙවන ලද මුදල්	(994,967)	(161,833)
ඉදිරියට ගෙන ගිය ශේෂය	**2,275,862**	**2,988,055**
සටහන -10		
බැංකු අයිරා		
ඩීඑෆ්සීසී වර්ධන බැංකුව ජ/ගි : 001001014270	3,932	3,932
සම්පත් බැංකුව ජංගම ගිණුම් අංක : 003410000057	-	589,833
	3,932	**593,765**
සටහන- 11		
ආදායම		
යටිමහන පාරිසරික බලපෑම් තක්සේරුව	4,072,950	1,163,700
කියුල් ඔය පාරිසරික බලපෑම් තක්සේරුව	-	1,625,500
තල්පිටිගල ව්‍යාපෘතිය-2017/03	-	448,538
මල්වතු ඔය 2013/49	-	2,195,030
එන්ටීඑස් කඳාන	-	4,093,816
ඩිජිටල් පද්ධතිය	15,171,975	-
ගිං නිල්වලා	11,134,086	-
මුන්දෙනි ආරු	908,000	-
	31,287,011	**9,526,584**
සටහන - 12		
සේවා පිරිවැය		
මුන්දෙනි ආරු	416,060	122,443
තල්පිටිගල නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම	328,500	203,201
යටිමහන ශක්‍යතා අධ්‍යයනය	-	166,936
කියුල් ඔය ව්‍යාපෘතිය	-	497,000
ගිං නිල්වලා නව පාරිසරික බලපෑම් තක්සේරුව	4,146,636	285,295
මාදුරු ඔය -CAMCE	-	59,500
මල්වතු ඔය පාරිසරික බලපෑම් තක්සේරුව	-	105,000
යටිමහන පාරිසරික බලපෑම් තක්සේරුව	1,284,977	929,076
ඩිජිටල් පද්ධතිය විය	4,387,668	-
ගල්ගෙකණ්ඩිය	1,297,190	-
	11,861,031	**2,368,450**

සීමා සහිත මහවැලි උපදේශක සේවා (පුද්ගලික) කාර්යාංශයේ
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ගිණුම් පිළිබඳ සටහන්

	2022 Rs.	2021 Rs.
සටහන - 13		
පරිපාලන වියදම්		
අලුත්වැඩියා සහ නඩත්තු M/V	636,684	363,119
අලුත්වැඩියා සහ නඩත්තු O/E	385,357	4,836
කාර්යාල අලුත්වැඩියාව සහ නඩත්තුව	44,773	75,656
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	505,467	152,098
ක්ෂය වීම	455,704	1,245,323
තැපැල් ගාස්තු	8,355	2,015
දුරකථන ගාස්තු	194,208	157,299
ඉන්ධන සහ ලිහිසි තෙල්	527,617	113,800
සුබසාධන	196,009	106,002
අතිකාල	114,562	93,691
ගමන් වියදම් සහ යැපුම් දීමනා	18,780	17,905
වැටුප් ප්‍රධාන කාර්යාලය	8,751,204	8,779,324
ගමන් දීමනාව	472,000	464,000
සේ.අ.අ. 12%	939,996	1,033,155
සේ.භා.අ. 3%	234,904	258,210
පුවත්පත් සහ වාර සඟරා	4,220	810
රක්ෂණ	138,604	141,941
මණ්ඩල රැස්වීමට පැමිණීමේ ගාස්තුව	24,000	60,000
පරිගණක භාවිතය	16,700	-
බලපත්‍ර සහ අවසර පත්‍ර	23,960	31,480
ව්‍යාපාර ප්‍රවර්ධනය	107,652	-
ජල,විදුලි, සහ පිරිසිදු කිරීමේ ගාස්තු-ශ්‍රී.ලං.ම.අ.	972,307	632,776
ලියාපදිංචි ගාස්තු	29,106	65,861
ජල ගාස්තු	57,200	32,280
පාරිතෝෂිතය	282,773	321,025
වෙනත් වියදම්	8,100	-
විගණන ගාස්තු	149,820	371,400
පරිගණක අලුත්වැඩියාව	11,000	4,450
ඉන්ධන දීමනාව	11,124	193,500
නිවාඩු දින ගෙවීම	7,950	3,638
මාසික දීමනාව ප්‍රධාන කාර්යාලය	1,659,372	1,967,243
අනුපාත	88,472	88,472
වෙළඳ දැන්වීම්	65,550	-
ප්‍රතිලාබ	300,000	-
නිවාඩු දින මුදල්	170,233	-
දඩ ගාස්තු	1,058	-
වාහන කුලියට දීමේ වියදම්	17,780	
කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය	59,700	-
	17,692,302	**16,781,308**

	2022	2021
	රු.	රු.
සටහන - 14		
මෙහෙයුම් නොවන ආදායම		
පොලී ආදායම්- ඉතිරි කිරීම්	47	695
ආයෝජන පොලී	3,688,326	2,417,880
වෙනත් ආදායම් (සටහන 14-A)	1,204,799	-
	4,893,172	**2,418,575**
සටහන - 14-A		
වෙනත් ආදායම්		
මාස 6 ක් ඉකුත්වූ වෙක්පත් ආපසු හැරවීම	47,000	-
වාහන කුලියට දීමේ ආදායම	329,240	-
ද්‍රව්‍ය තොග බැහැර කිරීමේ ලාභය	828,559	-
	1,204,799	**-**
සටහන - 15		
මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	193,686	79,606
බැංකු අයිරා පොලී	2,600	-
	196,286	**79,606**

සටහන - 16

පූර්ව වර්ෂ ගැලපීම

පූර්ව කාල දෝෂයේ ස්වභාවය	මූල්‍ය සීමාවෙන් බලපෑම් වූ අයිතමය	අගය (රු.)
• ලැබිය යුතු පොලී සඳහා වූ අධි ප්‍රතිපාදන ආපසු හැරවීම	ලැබියයුතු පොලී	(26,476)
• ගෙවිය යුතු ජල ගාස්තු සඳහා වෙන්කල අඩු ප්‍රතිපාදන නිවැරදි කිරීම-ශ්‍රී.ලං.ම.අ.	ගෙවිය යුතු ජල ගාස්තු - ශ්‍රී.ලං.ම.අ.	(99,367)
• ගෙවිය යුතු ජල ගාස්තු සඳහා වූ අධි ප්‍රතිපාදන ආපසු හැරවීම`-2021	ගෙවිය යුතු ජල ගාස්තු	4,000
• විගණන ගාස්තු අඩු ප්‍රතිපාදන නිවැරදි කිරීම-2021	ගෙවිය යුතු විගණන ගාස්තු	(10,800)
• ආදායම් බදු ප්‍රතිපූරණයෙන් අයකරගත් අනුමත නොවන ECS ගාස්තු	ආදායම් බදු ආපසු ගෙවීම්	(90,448)
		(223,091)